# නිවන දුටු එකාට ගල් ගැසීම
# සමන්ත භද්‍ර සාධකය



**දසුන් සිල්වා**

"නිර්වාණය".....මේක තමයි බෞද්ධ විමුක්ති මාර්ගයේ අවසානය හඳුන්වන නම. නිර්වාණය අවබෝධ කර ගැනීම එහෙමත් නැතිනම් නිවන් දැකීම කියන්නේ තෘෂ්ණාව නැති කිරීම කියලා සරලව කියනවා. තවත් විධිමත් ආකාරයට කියනවානම් අවිද්‍යාවෙන් තොරව තතු පරිද්දෙන් දැනගැනීම හෙවත් සත්‍ය අවබෝධ කිරීම. "නිර්වානයත් සං-සාරයත් අතර වෙනසක් නැත" කියල මහා-යාන කියමනක් ඇති බවට වල්පොළ රාහුල හිමියන්ගේ "බුදුන් වදාළ ධර්මය" පොතේ සඳහන්. ඒකෙන් අදහස් වෙන්නේ එකම දෙයක් දෙස අවිද්‍යාවෙන් බලන්නාට සං-සාරයත් ප්‍රඥාවෙන් බලන්නාට නිර්වාණයත් වේ කියන අදහස. නිවන කරා ලඟාවීමට ආර්ය අෂ්ඨාංගික මගෙහි ගමන් කල යුතු බවත් එමග අවසනදී සියලූ කෙලෙසුන් නසා චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගැනීමෙන් නිවන සාක්ෂාත් කරගත හැකි බවටත් සඳහන් වෙනවා.

බුද්ධ කාලයේ මේ කියන මාර්ගය ඔස්සේ ගිහින් නිවන් අවබෝධ කරගත් රහතන් වහන්සේලා විශාල ප්‍රමාණයක් ගැන අපිට අහන්න ලැබෙනවා. බුදුන්ගේ පිරිනිවනින් පසු ක්‍රම ක්‍රමයෙන් ලංකාව දෙසට බර වන බෞද්ධ සංස්කෘතික ඉතිහාසය තුල අපිට අවසන් වරට රහතන් වහන්සේලා ගැන අහන්න ලැබෙන්නේ අනුරාධපුර යුගයේදී. දුටු ගැමුණු රජතුමා රුවන්වැලිසෑය ගොඩනගන විට ඒ හා බැඳුනු රහතන් වහන්සේලා විෂාල ප්‍රමාණයක් ගැන ඉතිහාසයේ ලියවී තිබෙනවා.ඊට අමතරව මලියදේව කියන ලක්දිව අවසන් රහතන්වහන්සේ නමක් අපිට මුන ගැහෙන්නෙත් දුටු ගැමුණු යුගයේදීමයි. ඊට අවුරුදු 500ක් විතර යනකලූත් රහතුන් හිටි බවට අත්තනගලූ වංශයේ සඳහන් වෙලා තියන බවත් කියවෙනවා. කොහොම නමුත් ලාංකීය සින්හල බෞද්ධ බොහෝ දෙනා, අන්තිමට රහතුන් හිටි බවට දන්නේ බුදුන්ගේ කාලය හෝ දුටු ගැමුණුගේ කාලය. නයියාට උනත් අත්තනුගල වංශයේ කතාව අහු උනේ වැඩි පුර හොයන් යද්දී. ඒ නිසා රහතන් වහන්සේලා පිලිබඳ අපි දන්නා විස්තරය අඩුම ගානේ අවුරුදු 2000කට වඩා පැරණි එකක්.

වසර 2000ක් විතර පැරණි මේ දැනුම විසින් අපි ඉස්සරහ මවන රහතා Super Man වර්ගයේ Template එකකින් නිර්මිත කෙනෙක්. ඒ බොහෝ දෙනා විවිධ වර්ගයේ මානසික හා ශාරීරික super powers වලින් යුතු අය.ඉතින් මේ රහතන් වහන්සේ කියන කෙනා අපේ හිත් වල ඉන්න වීර චරිතයක් වගේ. ඔවුන්ට හිත් කියවන්න පුලූවන්, අහසෙන් ගමන් කරන්න පුලූවන්, නාසයෙන් ගිනි විදින්න පුලූවන් ආදී මෙකී නොකී ගොඩක් වැඩ දාන්න පුලූවන් අය. නිවන ලෙස මුලදී සඳහන් කරපු දේ කෙසේ වෙතත්, මේ අයගේ කැපී පෙනෙන දේ උනේ මේ ඉර්දි ප්‍රාතිහර්යයන් පෑමේ හැකියාව. ඊට අමතරව සමහරක් අය දුටු පමනින් සිත නිවී යන තරම් ශාන්ත වූ අය බව සඳහන්. හින්දු ආගමේ ඉන්න විවිධ බල පරාක්‍රමයන්ගෙන් අනූන දේව සභාවේ කතන්දර ඒ කාලෙ ජනයාගෙ (බුදුන් පිරිනිවන් පා කලක් ගියාට පසු කාලයේ) සිත් වසඟ කරගත්තාට සැකයක් නෑ. එහෙම බලද්දී තමන් හිසට තම අතමය සෙවනැල්ල වගේ කතාවක් කියන බුදු දහම ජනප්‍රිය බවින් අඩුව යන්නට ඇති ඉඩ කඩ බොහෝ වැඩී. එය වලක්වා ගැනීමේ අරමුණින් මේ super power තියන රහතන් වහන්සේලාගේ කතා බිහි වෙන්නට ඇති. ඊට අමතරව දෙවියන් පවා පොළවට වැඩලා ඔවුන්ට නමස්කාර කරන කතන්දර මේකට ඇතුලූ වෙන්නේ, දෙවියන් පවා රහතුන්ට, බුදුන්ට යටයි කියල මතුකරමින් දේවවාදී ආගම් දෙවනි තැනට ඇද දැමීමේ අරමුණ ඇතිව විය යුතුයි. ඒ නිසාම බුදුන්ගේ පිරිනිවනින් පසුව බිහි වන සාහිත්‍ය හා චිත්‍ර කලා නිර්මාණ වලදී රහතුන් මවන්නේ රැස් වලල්ලක් තියෙන, උඩින් යන්න පුලූවන්, රන්වන් පාටින් බබලන අනික් අයගෙන් පැහැදිලිව වෙන් කරල හඳුන ගන්න පුලූවන් භෞතික ලක්ෂණ විෂාල ප්‍රමාණයක් එක්ක. විය හැකි පරිදිම මෙහිදී සිත පිලිබඳ විග්‍රහය යට යමින් පිට ඔපයට පෙන්වන්න පුලූවන් භෞතික ලක්ෂණ සමූහයක් උඩට එනවා.

ඉතින් ඔය කියන ඒපවක්ඒ එක අනුව තමයි අපි දන්න කියනා රහතා නිර්මාණය වෙලා තියෙන්නේ.බහුදේව ආගමක් වන හින්දු ආගම සමග ඇතිවන තරගය ජයගැන්ම සඳහා බෞද්ධ සාහිත්‍ය විසින් මවන මේ template එක ඉතා දක්ෂ ලෙස කල වියමනක්. ඔය template එකට අනුව රහත් බව ලබන්න ඕනි කෙනෙකුට ආසාවක් ඇති වෙන්න ඕනි. නමුත් ඒ සඳහා ගමන් කල යුතු මාර්ගය බෞද්ධ සාහිත්‍ය තුලින් මවපු විචිත්‍රවූර්න powers තරම් happenning නෑ. නිවන් මාර්ගය කියන එක සම්පූර්ණයෙන්ම ඉලක්ක ගත වෙලා තියෙන්නේ පුද්ගලයාගේ සිත අරමුණු කරගෙන. සියලූ බැඳීම් වලින් සිත නිදහස් කරගෙන මැදහත් සිතින් ලෝකය බලන සමීකරණයක් ඒක. මුලදී පැහැදිලි කලා වගේ තෘශ්ණාවෙන් සිත ගලවාගන්නා මග ලේසි පහසු මගක් නෙවී. ක්‍රම ක්‍රමයෙන් පරිභෝජනවාදය කරා දිශානත වී, පරිණාමය වෙමින් පැවති ලෝකයක එය එන්න එන්නම කල නොහැකි දෙයක් බවට පත් වුනා. විසඳන්න උවමනාවක් නැති සමීකරණයක් බවට පත් වුනා. ඒ නිසා සමාජයක් ලෙස මේකට උත්තරයක් හොයාගන්න අවශ්‍ය උනා. ඒ නිසා තමයි ඉතා සූක්ෂ්ම ලෙස ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සම්මා වායාම කොටස ප්‍රමුඛ කර ගැනීමේ ව්‍යාපෘතිය ඇරඹෙන්නේ. ශීල ගනයට අයත් වන සම්මා * වාචා, ආජීව, කම්මන්ත කියන කොටස් ඒ වන විටත් සමාජ ආචාර ධර්මයන් ලෙසත් රටේ නීති පද්ධතියටත් ඇතුලූ වෙමින් තිබ්බ. සම්මා වායාම එහෙමත් නැතිනම් යහපත් වෑයම කියන මේ කොටසට තමයි කුසල් සමග ගනු දෙනු කරන කොටස ඇතුලත් වෙන්නේ. විස්තර සහිතව ගන්නවා නම් නූපන් අකුසල් ඉපදීම වැලැක්වීම, තමාතුල පවතන අකුසල් නැති කිරීම, නූපන් කුසල් ඉපදවීම හා උපන් කුසල් දියුණු කිරීම. ඉතින් මේ සම්මා වා-යාමය highlight කරලා අරගෙන විවිධ වර්ගයේ පුද පූජා ගොන්නක් එය සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් ඉතිහාසය පුරා හඳුන්වා දෙනවා. ඊට පස්සේ කාලෙක හින්දු බලපෑම නිසා ගැටගැසෙන ආත්මවාදයත් එක්ක තව තවත් මේ පුද පූජා ස්ථරයේ අවශ්‍යතාව වැඩිවෙන්න ගන්නවා

මේක කාගේවත් කූට ව්‍යපෘතියකට වඩා බෞද්ධයන්ගේ සාමූහික විඥානය තුලින්ම ඉල්ලා සිටි හා ක්‍රියාත්මක කෙරුණු වඩ පිලිවෙලක් ලෙසයි නයියාට හිතෙන්නේ. ඊට අමතරව රාජ්‍ය බලයත්, ආගම වෙනස් කිරීමේ ප්‍රධාන සාධකයක්. රජා ධාර්මික කරන්න කියලා දේශපාලනේට ගෑවෙන හමුදුරු ගොල්ල නතරවෙන්නේ රජ මාලිගාවේ තියන සැප සම්පත් පන්සලට අරන් ඇවිල්ලා. ඒකට අවශ්‍ය පදනම වැ-ටෙන්නේ දුටු ගැමුණුගේ යුද්ධයේ ආරම්භයත් එක්ක. හාමුදුරුවරු විසින් මහා විශාල මනුශ්‍ය ඝාතනයන් පවා නොපැකිලව සාධරණීකරනය කරන්න ආරම්භය ගන්නේ එළාර දුටු ගැමුණු යුද්ධයෙන්. නැවත මාතෘකාවට ආවොත් ක්‍රමයෙන් ඈත් වෙමින් යන නිවන සාක්ෂාත් කරගැනීමේ අඩුව පිරිමහන්න තමයි මේ පුද පූජා, ශාන්ති කර්ම හා දේව වන්දනා ආදේශ වන්නේ. මේ දේවල් ඉතා ශක්තිමත් වෙමින් ඉදිර්යඉදිරියටම ගමන් කරනවා. මොකද මේවා එක්ක මුදල කියන සාධකය ගැටගැසිලා තිබ්බ නිසා. ධනවාදී සමාජ ක්‍රමය බිහි වීමත් සමග මූලික වන මුදල නිසා ක්‍රමයෙන් ද්‍රව්‍යකරණය වෙන සමාජයට පුද පූජා template එක අපූරුවට පෑහෙන්න ගන්නවා. විසඳීමට අපහසු සමීක-රණයක් මත්තේ නැහෙනවා වෙනුවට මේ අලූත් ඒපවක්ඒ එක අපිට විසඳන්න පහසු එකක් වෙනවා. ඒකෙන් යෝජනා කරනවා මේ ජීවිත කාල්යේ පුලූවන් තරම් දන් දීලා, පුද පූජා පවත්වලා පිං ගොඩක් රැස් කරගෙන , ඊලඟ ආත්මයකදී නිවන් දකින්න එරහ කරමු කියලා. ජේනවනේ හරිම simple plan එකක්. මේ මාර්ගයේ ගමන් කරන්න සිත පිලිබඳ සිහියක් හෝ විදසුන් වැඩීමක් අවශ්‍ය නෑ. කරන්න තියෙන්නේ පුලූවන් තරම් හම්බ කරලා ඒකෙන් යම් කොටසක් පිං තකා වියදම් කිරීම පමණයි. ඒක ධනවාදී සමාජ ක්‍රමයත් එක්ක හරියටම ගැලපෙනවා. නිර්වාණ අවබෝධය නැතිනම් රහතෙක් දැකීම කියන එක අනුභූතිකව විය නොහැකි තත්වයට පත් වෙන්නේ මේ ක්‍රියාවලිය අනුව. ඒ නිසා අපි සමාජයක් ලෙස අවුරුදු 2000ක් තිස්සේ නිවන් අවබෝධ කරන එක කල් දමමින් ඉන්නවා.හැබැයි අපි අර රහත් tem-plate එක අමතක වෙන්න දෙන්නේ නෑ. කරන්නාවූ සියලූ පුද පූජා ,දාන මාන හා දේව වන්දනා අතරෙහි හාමුදුරුවරු අපිට පොඩි මතක් කිරීමක් කරනවා ලබන ආත්මයක නිවන් ලබන්න ඔනියි කියලත්. ඒ වගේම රහත් බවක් පිලිබඳ අවුරුදු 2000ක් තිස්සේම අනුභූතික සාක්ෂියක් නැති අපි අවිඥානිකව රහත් බවේ විය හැකි බාවය ප්‍රශ්න කරනවා.

මෙච්චර වෙලා අපි කතා කලේ වසර 2000කට ආසන්න කාලයක් තිස්සේ විය නොහැකි භාවයක් කරා ගමන් කරමින් ඇති රහත් බවට alternative එකක් විදිහට ප්‍රචලිත වෙමින් එන පුද පූජා සංස්කෘතිය සහ සාහිත්‍ය මගින් අපේ සිත් තුල පැළ කරපු රහත් template එක ගැන. නිර්වාණ අවබෝධය ඊලඟ භවයක් කරා කල් දමමින් එන මේ ක්‍රියාවලිය හරියට අපිට ඉස්කෝලේ කාලේදී හම්බවුණු අමාරු ගණිත ගැටලූ මග හැරීම වගේ එකක්. (අර ඒ දවස් වල අළු පාට කොටුවක ලවැඩිදුරටත්ල කියල සඳහන් කරල හැම පාඩමකම අන්තිමට තියන තියන ගණන් දෙක තුන). ඒ කාලේ සමහර අසීරු ගණිත ගැටලූ ගුරුවරුන් විසින්ම අපෙන් ඉවත් කර දමනවා. "ඕවා විභාගෙට එන්නෙත් නෑ...මේ වයසට ගැලපෙන්නේත් නෑ ඔය තරම් අමාරු ඒවා" කියල. ඉතින් ඒ වෙනුවට, අපි විසඳන්න පුලූවන් , ටීචරුත් අමාරුවේ වැටෙන්නේ නැති විදිහේ ගැටලූ විසඳමින් ඉගෙනීම කරනවා. ඇත්තටම ඉතින් ඒ කිව්ව අමාරු ඒවා විභාගෙට එන්නෙත් නැති නිසා කාටවත් ඕකේ අවුලක් නෑ. ඒ අතිශය අමාරු ගැටලූ ටික විසඳන්න කාටවත් උවමනාවක් වෙන්නේ නෑ. අපෙන් උඩ පන්ති වල ඉන්න එවුනුත් ඔය ගනන් ටික හදල නෑ කවදාවත්. නිවන් දැකීමත් ඒ වගේ. අපි කට්ටියත් එක්ක පුද පූජා ටිකක් තියලා නිර්වාන අවබෝධය ඊලඟ ආත්මෙකට කල් දානවා. නිවන් දැකපු කෙනෙකුත් සහස්‍ර දෙකකටම මුන ගැහිල නැති නිසා කාටවත් එකේ අවුලක් නෑ.

කස්ටියත් එක්ක ඔහොම සන්තෝසෙන් ඔය වැඩ ටික කරගෙන ඉන්දෙද්දි මෙන්න එනවා සමන්ත භද්‍ර කියල කෙනෙක්. එයා කියනවා එයා බුදු දහමේ තියන නිර්වානය අවබෝධ කරගත්ත බවත් ඒ නිසා එයා රහතෙක් බවත්. මේ කියමන අපි ජීවත් වන ඡ්බෙජීහ එක සම්පූර්ණයෙන් කඩා බිඳ දමනවා. යකෝ අපි කරන්න බෑ කියල ( අවිඥානිකව ) හිතන් හිටපු දේ මෙයා කලේ කොහොමද කියල ලොකු ප්‍රශ්නයක් මතු වෙනවා. ඇත්තටම අවිඥානිකව කිව්වට එහෙමමත් නෑ මට හිතෙන්නේ. ඇත්තටම අපිට නිවන් දකින්න සැබෑ උවමනාවක් තියනවද?....මේ අධි පරිභෝජනවාධී සංස්කෘතියේ පීන පීන නාමින් ඉන්න අපිට මේ කම් සැප අතහැරීමේ උවමනාවක් ඇත්තටම තියනවද?....ඒ සැප අත්හරිනවාට වඩා හොඳ නැත්ද ඔය පිනක් දහමක් කරල, දිනෙන් දින අලූත් වන , අත්කරගැනීම පහසු වන තාක්ෂණික ධනවා-දයේ මිහිරෙන් නැහැවෙන එක ?....ආර්ය අෂ්ඨාන්ගික මගෙහි දිගටම යන්නේ නැතුව සම්මා වායාමයේ නූතන edition එකෙන් අපේ ගමන නතර කරලා දකින නිවනක් ඊලඟ ආත්මයක දකින එක? .....පෙනෙන හැටියට නම් අපි කැමති විදිහ ඒක තමයි. අපිට නිර්වාන අවබෝධය සැබවින්ම උවමනානම් නම් සමන්ත භද්‍ර හිමියන් නිවන් අවබෝධ කරා කියල කිව්වම උන්වහන්සේගේ පන්සල ඉස්සරහ ලංකාවේ බෞද්ධයන්ගෙන් 80%ක්වත් පෙල ගැසිලා ඉන්න ඕනි නිවන් දකින විදිහ අහගන්න. මොකද අපිට අවුරුදු 2000කට පස්සේ ලැබෙන රහත් බවේ පළමු උදාහරණය තමයි සමන්ත භද්‍ර කියන්නේ. නමුත් එහෙම උනේ නෑ. 80%ක්ම කලේ උන්-වන්සේව සැක කරපු එක. තමන් විය නොහැකියි කියල හිතන් හිටපු මේ දෙය කරපු ඔහුව ප්‍රතික්ෂේප කරන විදිහක් බො-හෝ දෙනෙක්ට උවමනා උනා. ඒකට උදව් කරගත්තු ප්‍රධාන අයුධය තමයි අපි රහත් බව ලෙස විශ්වාස කල template එක.....ඒක භාවිතා කරමින් හැමෝම ඇහුවා කෝ super powers කියලා. උඩින් යන්න පුලූවන්ද?, නා-හෙන් ගිනි පිට කරන්න පුලූවන්ද, හිත් කියවන්න පුලූවන්ද එහෙමත් නැතිනම් දැක්ක පමණින් cool වෙලා යන රන්වන් විනීත පෙනුම තියනවද? .... .මේ කිසිවක් ඔහු ලඟ

38 වන පිටට